හෝමියෝපති වෛද්‍ය සභාව - 2019
--------------------------------------

**1.1** මතය
-------

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

වෛද්‍ය සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** මතය සඳහා පදනම
--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
----------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, වෛද්‍ය සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය වෛද්‍ය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වෛද්‍ය සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

වෛද්‍ය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වෛද්‍ය සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් වෛද්‍ය සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ වෛද්‍ය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලිද ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආරෝග්‍යශාලා මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආරෝග්‍යශාලා මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතාකර ඇති බව

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 28 (6) උප වගන්තිය | හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සඳහා වෛද්‍ය සභාව විසින් පවත්වාගෙන යනු ලබන ලේඛනය, ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තු ගෙවූ වෛද්‍යවරුන් හා නොගෙවූ වෛද්‍යවරුන් වෙන් වෙන්ව හඳුනා ගැනීමට හා හිඟහිටි ගාස්තුව හඳුනා ගැනීමට හැකි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | වෛද්‍යවරුන් ලියාපදිංචිය යාවත්කාලීන කිරීම සඳහා ගෙවන ගාස්තු සඳහන් ලේඛනයක් පවත්වා ගෙන යාමට නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බව. | හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීමේ ලේඛනය නිසි පරිදි හා යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 754 | සෑම මුදල් වර්ෂයකම අවසානයේ බඩු ලේඛන පොත තුළනය කළ යුතු වුවද, 2019 දෙසැම්බර් 31 දිනට පොදු ද්‍රව්‍ය ලේඛනය හා ශල්‍ය ද්‍රව්‍ය ලේඛනය තුළනය කර නොතිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 756 | ආයතනයේ බඩු පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදු කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩලයක් පත් කළ යුතු වුවත්, 2018 සහ 2019 වර්ෂ සඳහා සමීක්ෂණ මණ්ඩල පත්කර භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 16.1 වගන්තිය | 2014 හා 2015 වර්ෂවලදී බඳවාගෙන තිබුණු ඖෂධ සංයෝජකවරු 7 ක් හා වෛද්‍ය නිලධාරීන් 7 ක් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග 2020 අගෝස්තු 31 දින වන විටත් පවත්වා නොතිබුණි. මේ හේතුවෙන් මෙම නිලධාරීන් සේවයෙහි ස්ථිර කළ නොහැකිව තිබුණු අතර ඔවුන්ගේ පරිවාස කාලය දීර්ඝ කිරීමටද කටයුතු කර නොතිබුණි. | වෛද්‍ය සභා කාර්ය මණ්ඩලය වෙනුවෙන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව | විභාග පැවැත්වීම කඩිනම් කළ යුතු අතර එතෙක් නිලධාරීන්ගේ පරිවාස කාලය දීර්ඝ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2014 අගෝස්තු 13 දිනැති අංක පීඊඩී 25 (2) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ගිණුමක මුදල් තැන්පත් කළ යුතු වුවත්, 2009 වර්ෂයේදී අයකර තිබුණු පාඨමාලා ගාස්තු පෞද්ගලික බැංකුවක ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත්කර තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය රු.1,874,489 ක් විය. | මෙම ගිණුමෙන් මුදල් ඉවත්කර හෝමියෝපති අරමුදල පවත්වා ගෙන යන ලංකා බැංකු ගිණුමේ වෙන්කර තැබෙන මුදලක් ලෙස තැන්පත් කිරීමට නව වෛද්‍ය සභාව අමාත්‍යාංශය සමඟ එක්ව ක්‍රියාකරමින් සිටින බව. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.141,689 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.311,573 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.169,884 ක වර්ධනයක් නිරීක්ෂණය වූ අතර එම වර්ධනයට, රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන වැඩිවීම හා වෙනත් වියදම් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හෝමියෝපති වෛද්‍ය වෘත්තියෙහි යෙදීම ප්‍රවර්ධනය කිරීම, අභිවර්ධනය කිරීම හා නියාමනය කිරීම, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ පර්යේෂණ කිරීම හා ප්‍රවර්ධනය කිරීම, ඖෂධ වර්ග සහ වෙනත් පිළියෙල කිරීම් නිෂ්පාදනය, විකිණීම හා බෙදා හැරීම නියාමනය කිරීම හා පාලනය | වෛද්‍ය සභාවේ සියළුම සැලසුම් වෛද්‍ය සභාවේ යෝජනා මත සකස් කෙරෙන බැවින් වෛද්‍ය සභාව පත්කර නොතිබීම වාර්ෂික සැලැස්මක් සකස් නොකිරීමටද හේතු වූ බව හා 2020 සැප්තැම්බර් 09 දින | හෝමියෝපති වෛද්‍ය සභා පනතෙහි ඇති අරමුණු ඉටුකර ගැනීමට හැකි පරිදි ක්‍රියාකාරී සැලසුම් පිළියෙලකර ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරීම යන ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර නොතිබුණි. | පත් කරන ලද නව වෛද්‍ය සභාව විසින් ඉදිරි වර්ෂයන් සඳහා සැලසුම් සකස් කරන බව. | |
| (ආ) | හෝමියෝපති පනතේ 30(1) වගන්තිය ප්‍රකාරව, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සඳහා විභාගයක් පැවැත්වීමට 2018 වර්ෂයේදී අයදුම්පත් කැඳවා තිබුණු අතර අයදුම්පත් 189 ක් ලැබී තිබුණි. එසේ වුවද විභාගය පැවැත්වීම සඳහා නීති හා රෙගුලාසි සම්පාදනය කිරීම අවසන්කර නොතිබීම හා සභාවේ කටයුතු සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පැවතීම හේතුවෙන් 2020 අගෝස්තු 31 දින වන විටත් විභාගය පැවැත්වීමට හා වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීමට නොහැකි වී තිබුණි. | 2016 අංක 10 දරන පනතට අදාළ නීති හා රෙගුලාසි සම්පාදනය සඳහා අමාත්‍යාංශය කටයුතු කරමින් පවතින බව හා එම කටයුතු අවසන් වූ වහා හෝමියෝපති පනතේ 30(1) වගන්තිය ප්‍රකාරව විභාගය පැවැත්වීමට කටයුතු යොදන බව. | නීති, රීති, රෙගුලාසි සම්පාදනය කර ගැනීමේ කටයුතු හා විභාග පැවැත්වීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |

**3.2** මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් පවත්වාගෙන යන සායන 7 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ දෛනිකව සහභාගී වූ රෝගීන්ගේ සාමාන්‍යය 8 ත් 29 ත් අතර වුවද, දෛනික රෝගී සහභාගීත්වය වැඩිකර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමුකර නොතිබුණි. | 2019 වර්ෂය හෝමියෝපති වෛද්‍ය සභාව රැස් නොවී ගෙවී ගිය වසරක් බැවින් වෛද්‍ය සභාවේ තීරණයන් මත ක්‍රියාත්මක කළ යුතු කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව හා 2020 සැප්තැම්බර් 09 දින පත් කරන ලද නව වෛද්‍ය සභාව විසින් ඉදිරි වර්ෂයන්වල රෝගීන්ගේ සහභාගීත්වය වැඩිකර ගැනීම සඳහා සැලසුම් සකස් කරන බව. | රෝගීන්ගේ සහභාගීත්වය වැඩිකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

**3.3** නිෂ්ක්‍රීය හෝ හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකර 2009 වර්ෂයේදී ඒ සඳහා ලී බඩු හා වෙනත් අවශ්‍ය උපකරණ සපයාගෙන තිබුණි. එහි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට අදාළ නීතිමය රාමුව පිළියෙල කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබීම හේතුවෙන් 2020 අගෝස්තු 31 දින වන විටත් අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. ඒ අනුව මිලදීගෙන තිබුණු පිරිවැය රු.1,199,254 ක් වූ | වෛද්‍ය සභාව ක්‍රියාත්මක නොවීම නිසා මෙයට පිළියමක් ලැබී නොමැති බව | ඉදිකර ඇති ගොඩනැගිල්ල හා මිලදී ගෙන ඇති උපකරණ අදාළ අරමුණ වෙනුවෙන් යොදවා ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |

ස්ථාවර වත්කම් හා ඊට අදාළ ගොඩනැගිල්ල වර්ෂ 10 ට අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණි.

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 48 ක් වුවද තථ්‍යකාර්ය මණ්ඩලය 36 ක් විය. සභාව සඳහා අත්‍යවශ්‍ය තනතුරුවන වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙකු හා ඖෂධ සංයෝජකවරු 07 දෙනෙකුගේ පුරප්පාඩු 2020 අගෝස්තු 31 දින වන විටත් පිරවීමට කටයුතු කර නොතිබුණි. | කළමනාකරණ සහකාර තනතුරෙහි වන පුරප්පාඩුව සහ වෛද්‍යවරුන් දෙදෙනෙකු සඳහා ඇති පුරප්පාඩුව කඩිනමින් පිරවීමට නව වෛද්‍ය සභාව කටයුතු කරමින් සිටින බව හා ඖෂධ සංයෝජක පුරප්පාඩුව පිරවීම සඳහා අත්‍යවශ්‍යව පවතින NVQ සාමාර්ථය ලබා ගැනීමට අවශ්‍ය පාඨමාලාව සම්මත කිරීමේ කටයුතු අවසන් වීමෙන් අනතුරුව එම කාර්යය අවසන් කිරීමට බලාපොරොත්තු වන බව. | මෙම පුරප්පාඩු පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |